ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>ලෝක සෞඛ්‍ය සංවිධානයේ දකුණු සහ අග්නිදිග ආසියාතික රටවලින් සමන්විත කලාපයේ 78 වන සමුළුවේදී ඉන්දියාව සෞඛ්‍ය සම්පන්න අයුරින් වියපත් වීම යන කාරණය සම්බන්ධයෙන් සිය කැපවීම අවධාරණය කරයි</u>

රාජ්‍ය අමාත්‍ය ශ්‍රීමතී අනුප්‍රියා සිං පටෙල් මහත්මිය 2025 ඔක්තෝබර් 13-15 දිනවල කොළඹ පැවති ලෝක සෞඛ්‍ය සංවිධානයේ දකුණු සහ අග්නිදිග ආසියාතික රටවලින් සමන්විත කලාපයේ 78 වන සමුළුවේ අමාත්‍ය වටමේස සාකච්ඡාව සඳහා ඉන්දියාව නියෝජනය කරමින් සහභාගී විය. මෙම අමාත්‍ය හමුවේදී "ශක්තිමත් ප්‍රාථමික සෞඛ්‍ය සේවාවක් හරහා සෞඛ්‍ය සම්පන්න අයුරින් වියපත් වීම" යන තේමාව සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී.

2. මෙහිදී, ඉන්දියාව වැඩිහිටියන් සඳහා පුළුල් සහ ජනතා කේන්ද්‍රීය පද්ධතියක් මත පදනම්ව ශක්තිමත් ප්‍රාථමික සෞඛ්‍ය සේවාවක් හරහා සෞඛ්‍ය සම්පන්න අයුරින් වියපත් වීම යන කාරණය සම්බන්ධයෙන් සිය අඛණ්ඩ කැපවීම අවධාරණය කළේය.

3. වයස අවුරුදු 60 සහ ඉන් ඉහළ පුරවැසියන් මිලියන 153ක් ඉන්දියාවේ වසෙන බව ප්‍රකාශ කළ ශ්‍රීමතී අනුප්‍රියා සිං පටෙල් මහත්මිය ඉන්දියානු රජය වැඩිහිටියන්ගේ අවශ්‍යතාවයන් සපුරාලන සාධාරණ, පහසුවෙන් ප්‍රවේශ විය හැකි සහ දැරිය හැකි සෞඛ්‍ය සේවාවන් සහතික කිරීම සඳහා වැදගත් පියවර රැසක් ගෙන තිබෙන බව පෙන්වා දුන්නාය.

4. කලාපීය රටවල් අතර පැවති වටමේස සාකච්ඡාවේදී ඉන්දියාව ප්‍රාථමික සෞඛ්‍ය සේවාව සහ දිගු කාලීන රැකවරණය ඒකාබද්ධ කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ දකුණු සහ අග්නිදිග ආසියාතික රටවල් අතර සහයෝගීතාවය ඉහළ නැංවිය යුතු බව ප්‍රකාශ කළේය. ඉන්දියාව සහයෝගීතාවය සඳහා ප්‍රධාන අංශ තුනක් යෝජනා කළේය.

අ. ප්‍රාථමික සෞඛ්‍ය සේවාව සහ දිගු කාලීන රැකවරණය ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් දැනුම බෙදා හදා ගැනීම සහ නවෝත්පාදනය සඳහා කලාපීය වේදිකාවක් ස්ථාපිත කිරීම

ආ. සියලු රටවල වැඩිහිටි සෞඛ්‍ය සහ රැකවරණය සම්බන්ධයෙන් කටයුතු කරන ශ්‍රම බලකාය සඳහා ධාරිතා ගොඩනැගීමේ සහ පුහුණු වැඩසටහන් සඳහා ආයෝජනය කිරීම

ඇ. වැඩිහිටියන් සඳහා ස්වාධීන සහ ගෞරවනීය ජීවිතයකට මඟ පාදන තාක්ෂණික නවෝත්පාදන සහ සෞඛ්‍ය විසඳුම් ප්‍රවර්ධනය කිරීම

5. ඉන්දියාව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කර ඇති සෞඛ්‍ය සම්පන්න අයුරින් වියපත් වීමේ දශකය (2021-2030) හා එක්ව කටයුතු කරන බව ප්‍රකාශ කළ රාජ්‍ය අමාත්‍යතුමිය වියපත් වීම සියලු දෙනා ඇතුළත් වන වර්ධනයට සහ සමාජ පරිවර්තනයට අවස්ථාවක් ලෙස දැකිය යුතු බව අවධාරණය කළේය. පුරවැසියන් සැඳෑ සමය ඇතුළු ජීවිතයේ සෑම අවධියක්ම ගෞරවනීයව, ආරක්ෂිතව සහ නිසි රැකවරණයක් සහිතව ජීවත් වන බව සහතික කිරීම සඳහා ඉන්දියාව තවදුරටත් කැපවී සිටින බව ඇය ප්‍රකාශ කළාය.

6. රාජ්‍ය අමාත්‍යතුමිය ඉන්දියානු සහ ශ්‍රී ලංකා රජයන් විසින් ඩිජිටල් සෞඛ්‍ය පිළිබඳව පවත්වන ලද වැඩසටහනක් ද ඇමතූ අතර ඒ සඳහා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සහ ජන මාධ්‍ය අමාත්‍ය නලින්ද ජයතිස්ස මහතා ද සහභාගී විය. ඇතැම් නියෝජිතයන් මාර්ගගත ආකාරයෙන් ද සහභාගී වූ මෙම වැඩසටහන තුළින් ඩිජිටල් සෞඛ්‍ය පද්ධති සැලසුම් ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයේ දකුණු සහ අග්නිදිග ආසියාතික රටවල් විසින් අත්කර ගෙන තිබෙන ප්‍රගතිය ප්‍රදර්ශනය කරන ලදී. එසේම, මෙ වැඩසටහන මනා පිළිවෙත් බෙදා හදා ගැනීම, පොදු අභියෝගයන්ට මුහුණ දීම සහ කලාපය පුරා ඩිජිටල් සෞඛ්‍ය පරිවර්තනය ඉහළ නැංවීම උදෙසා රටවල් අතර සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා මනා වේදිකාවක් විය.

*****

**කොළඹ**
***2025 ඔක්තෝබර් 16***